# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## උතුරු පළාත
## පළාත් මට්ටමේ අවසාන පොදු වාර පරීක්ෂණය 2013
## ඉතිහාසය

ශ්‍රේණිය -11 | කාලය පැය දෙකයි

විභාග අංකය . . . . . . . . . . . . | ලකුණු

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුරු තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

01) "අතීතය අමතක කර ක්‍රියා කිරීම අත්තිවාරමක් නොමැතිව ඉදි කරන ඉදි කිරීමක් වැනිය " නැමති අදහස ඉදිරිපත් කළ ඉතිහාසඥයා
1. ජී.එම්. තිරවෙලියන් මහතා  2. ඊ.එච්. කාර් මහතා
3. ජවහර්ලාල් නේරු මහතා  4. මහත්මා ගාන්ධි මහතා

02) පහත සඳහන් සෙල්ලිපි අතුරින් ආරාම පාලනය ගැන සඳහන් සෙල්ලිපියක් නොවන්නේ
1. කළුදිය පොකුණ ලිපිය  2. අභයගිරි සංස්කෘත ලිපිය
3. මිහින්තලා පුවරු ලිපිය  4. ගල්පොත ශිලා ලේඛනය

- පහත සඳහන් දත්ත ඇසුරින් 3,4,5 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - කණිෂ්කන්  B - ධර්මාශෝක  C - සමුද්‍රගුප්ත
D - දෙවන චන්ද්‍ර ගුප්ත  E - බිම්බිසාර

03) 4 වැනි ධර්ම සංගායනාව සම්බන්ධ රජු
1. A  2. B  3. E  4. D

04) සාංචි ස්තූපය නිර්මාණය කළ රජු
1. A  2. C  3. B  4. D

05) ගුප්ත යුගයේ සංස්කෘතිය වෙනුවෙන් අගනුවරක් පිහිටු වූ රජ
1. C  2. D  3. B  4. E

06) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූ මිනිසා ස්වභාව ධර්මය සමග ජීවත් වීමට තම ජීවිතය සරල කර ගැනීම සඳහා පරිහරණය කළ ක්‍රමයක් නොවන්නේ
1. ගල් මෙවලම් පරිහරණය කිරීම
2. ගින්දර උපදවා භාවිතා කර කිරීම
3. ස්වභාවික ද්‍රව්‍යයන් ගෙන වාසස්ථාන නිර්මාණය කිරීම
4. වාරිමාර්ග පද්ධති සකස් කිරීම

07) **"A"** තීරයේ රජවරුන් ද **"B"** තීරයේ ඔවුන්ගේ නිර්මාණ ද දී ඇත. **A** තීරය හා **B** තීරය සම්බන්ධ කළ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "A" තීරය | "B" තීරය |
|---|---|
| 1. දුටු ගැමුණු | A. මහා මෙවුනා |
| 2. දේවානම්පියතිස්ස | B. අභයගිරිය |
| 3. වලගම්බා | C. රුවන් වැලි සෑය |
| 4. මූටසිව | D. ඉසුරුමුණිය |
| | E. ජේතවනාරාමය |

1. CDBA  2. CBDE  3. CBDA  4. EDAB

08) පහත සඳහන් A, B ප්‍රකාශ කියවා ඒවා සමග සම්බන්ධ රජතුමා තෝරන්න.
A. ලංකාව පෙරදිග ලෝකයේ ධාන්‍යාගාරය යනුවෙන් නම් දැරීම
B. අංගමැඩිල්ල ඇළ නිර්මාණය කිරීම

1. පළමුවන විජයබාහු රජ 2. දෙවන පරාක්‍රමබාහු රජ 3. නිශ්ශංකමල්ල රජ 4. වසභ රජ

09) “ A ” තීරයත් “ B ” තීරයත් සම්බන්ධ කිරීමේ දී ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| “A” තීරය | “B” තීරය |
|---|---|
| 1. ධාතුසේන | A.අභය වැව |
| 2. දෙවන මුගලන් රජතුමා | B.කලාවැව |
| 3. වසභ රජතුමා | C.නාච්චදුව වැව |
| 4. මහසෙන් රජතුමා | D. නොච්චිපොතාන |
| | E. කවුඩුලු |

1 . ABCD 2 . BCDE 3 . BCED 4 . BDCE

10) පහත සඳහන් වැවේ කොටස් අතුරින් වැවේ රොන් මඩ එකතුවීම වැළකෙන්නේ කුමකින්ද?
1. පිටවාන 2. සළපනාව 3. කුඩා වැව් 4. බිසෝකොටුව

11) පහත සඳහන් අතුරින් නොගැළපෙන කාණ්ඩය තෝරන්න.
1. දේවරික - දොරටුපාලක
2. මහලේනා - වාණිජ නිලධාරී
3. බඩගරික - භාණ්ඩාගාරික
4. මාපා - දක්ෂිණ දේශයේ පාලකයා

12) ශ්‍රී ලංකාවේ සිංහල ජනතාව සමග යහපත් ඇසුරක් පවත්වා ගෙන ගිය ආර්යය චක්‍රවර්ති වන්නේ
1. කුලශේකර ආරියන් 2. ජයවීර 3. කුණවීර 4. විරෝදය

13) පහත සඳහන් ඒවා අතුරින් දෙවන පරාක්‍රමබාහු රජතුමා විසින් රචන කරන ලද කෘතිය වනුයේ
1. විශුද්ධි මාර්ග සන්නය
2. මයුර සංදේශය
3. ගුත්තිල කාව්‍ය
4. පූජාවලිය

14) ඉන්දියාවේ දිල්ලි සුල්තාන්ගේ රාජ්‍ය සමයේ දී අරාබි මුදල් හඳුන්වා දුන් රජ වනුයේ
1. අලාවුදීන් ඛල්ජි
2. මොහමඩ් බින් ටුග්ලග්
3. ඉල්තුත්මිෂ්
4. කුටුබ් - උද්දීන් - අයිබෙක්

15) ඉන්දියාවේ මෝගල් අධිරාජ්‍ය සමයේ අක්බර් රජතුමාගේ පාලනයට අයිති නොවූ ප්‍රදේශ වනුයේ
1. උතුරු ඉන්දියාව - දකුණු ඉන්දියාව
2. උතුරු ඉන්දියාව- දක්ෂිණ දේශය
3. වයඹ ඉන්දියාව - දක්ෂිණ දේශය
4. දක්ෂිණ දේශය - දකුණු ඉන්දියාව

16) පහත සඳහන් අතුරින් යුරෝපයේ වැඩවසම් ක්‍රමයේ ලක්ෂණයක් නොවනනේ මින් කුමක් ද?
1. පූජකවරුන්ට බලතල හිමි වී තිබිණි
2. කලා ශිල්පීන්ට නිදහස් ලබා දී තිබිණි
3. වහල් ක්‍රමයක් දක්නට ලැබිණි
4. ආගමික වශයෙන් එක්සත් වී තිබිණි

17) පහත දී ඇති ඒවායින් මයිකල් ඇන්ජිලෝගේ නිර්මාණය අඩංගු නිවැරදි කාණ්ඩය වන්නේ
1. මොනාලිසා ,පීටා රුව, මෝසස්
2. අවසාන තීන්දුව ,ශාන්ත පීතර දෙව්මැදුර, මොනාලිසා
3. අන්තිම රාත්‍රි භෝජනය, මොනාලිසා, මඩෝනා
4. අවසාන තීන්දුව ,ශාන්ත පීතර දෙව්මැදුර, පීටා රුව

18) A - දෙවියන් වහන්සේ මාහට උදව් කරයි යනුවෙන් ප්‍රකාශ කර වසර හයක් සැඟ වී සිටීම
B - බයිබලය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම
C - ආගමික පුනරුදයේ පහන් තරුව යනුවෙන් හඳුන්වනු ලැබූ කෙනෙක්
D - දේව සභාව විසින් මරා දැමීම
ඉහත දක්වා ඇති ප්‍රකාශ අතුරින් ජෝන් වයික්ලිෆ් හා සම්බන්ධ ප්‍රකාශ තෝරන්න.
1. B, C 2. A, B 3. C, D 4. B, A

19) “අ” තීරය “ආ” තීරය සමග සම්බන්ධ කිරීමේ දී ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| “අ” තීරය | “ආ” තීරය |
|---|---|
| 1. රෝසමල යුද්ධය | A. ස්පාඤ්ඤය |
| 2. ගෝල් දේශය | B. පෘතුගාලය |
| 3. ඇමෙරිකාව සොයා ගැනීම | C. එංගලන්තය |
| 4. පෙරදිග මාර්ගය හඳුනා ගැනීම | D. ප්‍රංශය |
| | E. ඕලන්දය |

1 . ABCD 2 . CABD 3 . CDAB 4 . CDBA

20) සීතාවක රාජධානියේ වර්ධනයට හා පරිහානියට හේතු වූ රජ
1. මායාදුන්න 2. පළමුවන රාජසිංහ 3. දෙවන රාජසිංහ 4. හයවන විජයබාහු

21) උඩරට රාජධානියට පෘතුගීසින් විසින් කළ අවසාන සටන කුමක්ද?
1. දන්තුරේ 2. බලන 3. ගනේතැන්න 4. ගන්නොරුව

22) පහත සඳහන් දේ අතුරින් පේෂ කර්මාන්තය සඳහා සොයා ගැනීම තෝරන්න.
1. ආරක්ෂක ලාම්පු 2. ජල වාෂ්ප එන්ජිම
3. මියුල් යන්ත්‍රය 4. බෙසමර් ක්‍රමය

23) පහත සඳහන් පුද්ගලයන් අතුරින් ඉතාලියේ එක්සත් කිරීමේ ව්‍යාපාරය හා සම්බන්ධ නොවන පුද්ගලයා වන්නේ
1. මෙටර්නික් 2. ජෝසප් මැසිනි 3. ගැරිබෝල්ඩි 4. නැපෝලියන් බොනපාර්ට්

24) ආහාර , ඉඩම් හා සාමය යන පාඨය හා බැඳුණු විප්ලවය කුමක් ද?
1. රුසියා විප්ලවය 2. ප්‍රංශ විප්ලවය
3. ඇමෙරිකා නිදහස් සටන 4. ඉංග්‍රීසි විප්ලවය

25) ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමේ පාලනය අවසානයට ගෙන ආ වසර වනුයේ කුමක් ද?
1. 1796 2. 1802 3. 1815 4. 1798

26) 1848 විමුක්ති අරගලයට ආසන්නම හේතුවක් වන්නේ මින් කුමක් ද?
1. රාජකාරී ක්‍රමය අවලංගු කිරීම 2. මුඩු බිම් පනත ක්‍රියාත්මක කිරීම
3. ගම්සභා අක්‍රිය වීම 4. ටොරිංටන් සාමිවරයාගේ බදු ප්‍රතිපත්තිය

- පහත සඳහන් තොරතුරු මූලික කරගෙන **27, 28** යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - ලංකාව පළාත් නමයකට බෙදීම
B - දෙමළ ජනතාවට හා සිංහල ජනතාව අතර මතභේද ඇතිවීමට හේතු වීම
C - ව්‍යවස්ථාදායක සභාවට පළමු වරට නිල නොලත් සාමාජිකයින් තෝරා ගැනීම
D - සර්ව ජන ඡන්ද බලය ලබා දීම
E - පළමු වරට පළාත් මට්ටමින් නියෝජිතයින් තෝරා ගැනීම
F - ආණ්ඩුකාරවරු ක්‍රමය හඳුන්වාදීම

27) මැනිං ආණ්ඩුක්‍රමය හා සම්බන්ධ කරුණු දක්වන අක්ෂර
1. D, E 2. D, F 3. B, C 4. B, F

28) " F " ප්‍රකාශය හා සම්බන්ධ ආණ්ඩුක්‍රමය කුමක් ද?
1. කෝල්බෲක් 2. සෝල්බෙරි 3. මැනිං 4. මැකලම්

29) ශ්‍රී ලංකාවේ කෝපි වගාව හඳුන්වා දුන් යුරෝපීය ජාතීන් වන්නේ
1. බ්‍රිතාන්‍යයන් 2. පෘතුගීසින් 3. ප්‍රංශ ජාතීන් 4. ඕලන්දයන්

30) වෘත්තීය සමිතීන්වල පියා යනුවෙන් හඳුන්වන්නේ
1. A. E. ගුණසිංහ 2. කෝ . නඩේස අයියර් 3. D. S. සේනානායක 4. N. M. පෙරේරා

31) දේශන කලාව දෙමළ භාෂාවට එක් කළ කෙනෙකි
1. ශ්‍රීමත් පොන් . රාමනාදන් 2 ශ්‍රීමත් පොන් අරුණාචලම්
3. ආරුමුග නාවලර්තුමා 4. විපුලානන්දතුමා

32) බ්‍රිතාන්‍ය පාලනය සමයේ අධ්‍යාපන පරිපාලනය සඳහා ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තුමේන්තුවක් හඳුන්වා දුන් කමිටුව කුමක් ද?
1. ඩොනමෝර් කමිටුව 2. මෝර්ගන් කමිටුව
3. කෝල්බෲක් කමිටුව 4. මියුරන් කමිටුව

33) සයිමන් කමිටුව පැමිණීමට විරුද්ධව නැගී සිටිය දී බ්‍රිතාන්‍ය ආරක්ෂකයන්ගේ පහර දීම්වලට ලක් වී ජීවිතක්ෂයට පත් වූ ඉන්දීය ජාතික කොංග්‍රසයේ සාමාජිකයා වූයේ
1. අරවින්දකෝස් 2. ලාලා ලජ්පත් රායි
3. බිපින් චන්ද්‍රපෝල් 4. ගෝපාල ක්‍රිෂ්ණා ගෝඛලේ

34) ඉන්දියාවට නිදහස් ලබා දීමේ දී ඉන්දියාවේ ප්‍රතිරාජයා වශයෙන් සිටියේ කවුද?
1. මවුන්ට් බැටන් සාමිවරයා
2. කනිං සාමිවරයා
3. රාජගෝපාල ආචාර්යතුමා
4. හෙන්රි මංමේසන් මූර්

35) පළමු මහා යුද්ධ අවසානයේ දී ජය ගත් රටවල් පරාජය වූ රටවල් සමග ගිවිස ගත් ගිවිසුමකින් එක් ගිවිසුමක් වනුයේ මින් කුමක් ද?
1. අත්ලන්තික් සම්මුතිය
2. මියුනික් සම්මේලනය
3. වෝර්සෝ ගිවිසුම
4. මොස්කෝ සම්මුතිය

36) ලෝක මහා යුද්ධයේ දී කටයුතු කළ පහත දී ඇති බ්‍රිතාන්‍ය නායකයන් කාල අනුපිළිවෙලට සකස් කළ විට ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ
A. වින්සන්ට් චර්චිල්
B. ලොයිඩ් ජෝර්ජ්
C. ක්ලයිමන් ඇට්ලි
D. නෙවිල් චේම්බර්ලින්

1. BADC
2. BDAC
3. DCAB
4. CBAD

37) වර්තමානයේ අක්‍රිය වී ඇති එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතනවලින් එකක් වනුයේ
1. ආර්ථික සමාජීය මණ්ඩලය
2. මහා මණ්ඩලය
3. ආරක්ෂක මණ්ඩලය
4. භාරකාර මණ්ඩලය

38) පහත සඳහන් පිළිතුරු අතුරින් එකක් අනෙක් ඒවා සමග නොගැලපේ. එය තෝරන්න.
1. I. L. O
2. මොසාඩ් (MOSSAD)
3. K. G. B
4. C. I. A

39) දීර්ඝ කාලයක් කියුබාවේ නායකයා වශයෙන් සිට රෝගාතුර වී මේ වසරේ ජීවිත්කෂයට පත් වූ සමාජවාදි නායකයා මින් කවුරු ද?
1. බෙයිස්ට් සෝම්පේ
2. කර්නල් ගඩාෆි
3. ෆිදෙල් කස්ත්‍රෝ
4. හියුගෝසාවේස්

40) ශ්‍රී ලංකාවේ මැතිවරණ සම්බන්ධ පැමිණිලි විභාග කිරීම සඳහා බලතල සතු අධිකරණ වන්නේ
1. දිසා අධිකරණය
2. අභියාචනා අධිකරණය
3. මහේස්ත්‍රාත් අධිකරණය
4. ශ්‍රේෂ්ඨාධිකරණය

*****